**පොල් ඉඩම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම යටතේ පොල් ඉඩම් විවිධාංගීකරණය**

තනි බෝගයක් ලෙස පොල් වගා කිරීම අකාර්යක්ෂම ඉඩම් කළමනාකරණ ක්‍රමයක් වන අතර අඩු ඵලදායිතාවයක් මෙන්ම ආර්ථික වාසි ද අඩු වේ .එකම ක්ෂේත්‍රයේ පොල් වගාවට අමතරව වෙනත් බෝග වර්ග එකක් හෝ කිහිපයක් අතුරු බෝග ලෙස වගා කිරීම තුළින් පොල් ඉඩම් මේ ඵලදායිතාවය ඉහළ නැංවිය හැක. පොල් වගාව සඳහා යොදා ගන්නා වැඩි පරතරයද ගස් අතර පොළොවට වැටෙන ආලෝක ප්‍රමාණය ද අතුරු බෝග වගා කිරීමට මනා පිටුවහලක් ලබා දෙයි.එසේ ම තෙත් හා අතරමැදි කලාප වල පොල් ඉඩම් හෙක්ටයාර 200’000 දෙකක් පමණ අතුරු බෝග වගාව සඳහා යොදා ගත හැකි වීම ,පොල් වගාව සඳහා යොදාගන්න පාංශු යෝග්‍යතා පන්තීන් වන S2, S4, S5 යන පන්තීන් වල අයත් පස් සහිත ඉඩම්වල අතුරු බෝග වගා කිරීමට ඇති හැකියාව හා ක්‍රමවත්ව මනා කළමනාකාරීත්වයෙන් යුත් අතුරු බෝග වගාවකදී පොල් ඵලදාව වැඩිවීම ද පොල් ඉඩම්වල අතුරු බෝග වගා කිරීමට මනා පිටුවහලක් ලබා දේ.

නමුත් පොල් යටතේ අතුරු බෝග වගාව සිදු කරන විට, සූර්යාලෝකය, ඉඩ කඩ ප්‍රමාණය ,පසේ පෝෂනීය (සරුබව) තත්වය, පසේ තෙතමනය ,භූමියේ පිහිටීම වෙළෙඳපොළ ඉල්ලුම හා සමාජය සමාජයීය කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතුය .

**අතුරු බෝග වගාව යටතේ ලැබෙන වාසි**

- අපතේ යන සූර්යාලෝකය සහ තෙතමනය ප්‍රයෝජනයට ගත හැකිය
- ඉඩමේ සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගත හැකිය
- ඉඩමට ලැබෙන හිරු එළිය භාවිතය කාර්යක්ෂමතාවය වැඩි කරයි
- අතුරු බෝග මුල් විහිදී යාමෙන් පසු පසේ ජල වහනය සහ වාතනය ඉහල දමා පසේ තත්වය වැඩි දියුණු කිරීම.
- අතුරු බෝග නිසා පසට විශාල කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දෙයි.මෙයින් පසේ පෝෂණ තත්ත්වය ඉහළ යන අතර ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය ඉහළ දමයි .
- පාංශු වැස්මක් ඇති වීම නිසා සහ පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ යන නිසා පසේ තෙතමනය ආරක්ෂා කරයි.
- අධික වර්ෂාපතනය ඇති කරන පාංශු ඛාදනය අඩු කිරීමට අතුරු බෝග සමත් වේ .
- සමහර අතුරු බෝග වගා කිරීමෙන් පොල් අස්වැන්න ඉහළ යන බව පර්යේෂණ වලින් සොයා ගෙන ඇත.
- පොල් වගාව තුල වගා කරන අතුරු බෝග ගොවියාගේ එදිනෙදා ප්‍රයෝජනයට යොදාගත හැකිය.
- වල් මර්ධන වියදම අඩු කරයි .
-

සාර්ථක අතුරු බෝග වගාවක් සඳහා සැලකිය යුතු සාධක

- පොල් ගස් වල වයස සහ හිරු එළිය - පොල් ගස් වල වයස සහ හිරු එළිය සලකමින් පහත පරිදි බෝග තෝරා ගත හැකිය.

| **පොල් වගාවේ වයස** | **බිම් ස්තරයට ලැබෙන හිරු එළිය** | **අවුරුද්දට අඩු කෙටිකාලීන බෝග** | **අවරුදු 4-5 පවතින මධ්‍ය කාලීන බෝග** | **අවුරුදු 10 ට වැඩියෙන් පවතින දිගු කාලීන බෝග** |
|---|---|---|---|---|
| අවුරුදු 0-5 | ආලෝකය සීමාවකින් තොරව ලැබේ | එළවලු, කහ, ඉගුරු, අල වර්ග, ධාන්‍ය වර්ග, | අන්නාසි<br>වැල්දොඩම්<br>පැපොල්<br>පේර | - |
| අවුරුදු 6-20 | බිම් ස්තරයට ලැබෙන හිරු එළිය ප්‍රමාණය සීමා සහිත වේ | ඉගුරු ,අල වර්ග | - | තෘණ වර්ග |

| | | | | |
|---|---|---|---|---|
| අවුරුදු 21-50 | පොල් ගස් වල උඩු වියන කුඩාවේ.ආලෝකය ලැබෙන ප්‍රමාණය වැඩිවේ | ඉගුරු ,අල වර්ග | | ගම්මිරිස්, කොකෝවා, කුරුඳු, කරාබු නැටි, සාදික්කා, එනසාල් , තෘණ වර්ග |
| අවුරුදු 51-70 | යටි වගාව සිදුකරයි | එළවලු | අන්නාසි කෙසෙල් | - |

- පාංශු තෙතමනය -අතුරු බෝග වගා වගා කිරීම තෙත් කලාපයට පමණක් සීමා කිරීම හෝ අර්ධ තෙත් අතරමැදි කලාපයේදී අතිරේක ජලය අවශ්‍ය වේ. තෙතමනය සඳහා තරගයක් ඇති කිරීම වැළැක්වීමට සියලු අතුරු බෝග පොල් ගසේ සිට මීටර් දෙකක් දුරින් (පොහොර කවයට පිටතින්) සිට විය යුතුය .
- ශාක පෝෂක -පොල් මෙන්ම අතුරු බෝග සඳහා ද නිර්දේශිත පොහොර යෙදීම ඉහල ඵලදායිතාවයක් සඳහා අනිවාර්ය වේ.
- පාංශු ලක්ෂණ -අතුරු බෝග සඳහා සුදුසු සාරවත් පසක් තෝරා ගත යුතුය. ඒ සඳහා පහත පාංශු ලක්ෂණ සලකා බැලිය යුතුය. පසේ ගැඹුර, පසෙහි වයනය, ජලය බැස යාම, ජලය රඳවා ගත හැකි ප්‍රමාණය, පසේ pH අගය , කැටායන හුවමාරු ධාරිතාවය .
- බෝග තෝරා ගැනීම -දේශගුණික හා පාංශු ලක්ෂණ සලකා බලමින් අතුරු බෝග තෝරා ගත යුතුය
- වර්ෂාපතන සහ දේශගුණය -අතුරු බෝග විවිධ වර්ධන අවස්ථාවන්ට අනුකූලවන ජල අවශ්‍යතාවයන්ට වර්ෂාපතන ව්‍යාප්තිය ගැලපිය යුතුය .උදාහරණ -තෙත් හා අතරමැදි කලාප සඳහා ගම්මිරිස් ,අතරමැදි වියළි කලාප සඳහා බද්ධ කරන ලද කජු හා දෙහි .
- හිරු එළියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම - හිරු එළියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අතුරු බෝග පේළි නැගෙනහිර බටහිර දිශාවට මුහුණලා පිහිට විය යුතුය .
- වගා භූමියේ බෑවුම -පාංශු ඛාදනය අවම වන අයුරින් සැලසුම් කළ යුතු ය .උදාහරණ කෝපි ගම්මිරිස් බෑවුම් සහිත ඉඩම් සඳහා ද ඉඟුරු අන්නාසි අඩු බෑවුම් සහිත භූමි වලට සුදුසු වේ.
- අලෙවිය හා සැකසුම -පහසුවෙන් අලෙවි කළ හැකි බෝග පමණක් අතුරු බෝග ලෙස සිටුවීම සුදුසු වන අතර අලෙවි මධ්‍යස්ථාන පහසුකම් පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.
- කම්කරු අවශ්‍යතාවය -අතුරු බෝග වගාව මඟින් රැකියා වැඩි ප්‍රමාණයක් සපයනු ලැබේ සමහර බෝග සඳහා වැඩි කම්කරු ශ්‍රමයක් යෙදවිය යුතු බැවින් කම්කරු ශ්‍රමය පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය.

**පොල් ඉඩම් සඳහා තෝරා ගත හැකි අතුරු බෝග වර්ග**

- කන්න බෝග (කාල සීමාව වසරකට නොවැඩි ) - ඉඟුරු, කහ, මඤ්ඤොක්කා, අල වර්ග බතල, කිරි අල, අල, බඩ ඉරිඟු, එළවළු වර්ග, විසිතුරු මල් වර්ග
- අර්ධ බහු බහුවාර්ෂික බෝග (කාල සීමාව වසර 2-5) - අන්නාසි, කෙසෙල්, වැල්දොඩම් බුලත්, පැපොල් , ඩ්‍රැගන් ෆෘට්
- බහු වාර්ශික භෝග (ඒ කාල සීමාව වසර 10 ට වැඩි ) - කොකෝවා, කෝපි, ගම්මිරිස්, කුරුඳු, තේ, කරාමු, අලිපේර, තෘණ වර්ග, සාදික්කා, පුවක්, පේර, රඹුටන්, මැංගුස්, බද්ධ කජු, දෙහි, අඹ

ඉතා විශාල සංඛ්‍යාවක බෝග වර්ග පොල් යටතේ අතුරු බෝග ලෙස වගා කල හැක නමුත් පසේ ගැඹුර පාංශු කාණ්ඩය මෙන්ම ප්‍රදේශයේ වර්ෂාපතනය පිළිබඳවද බෝග තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතුය ගැඹුරු මූල පද්ධතියක් ඇති කෝපි කුරුඳු කරාබු නැටි සාදික්කා දෙහි වැනි බෝග ගැඹුරු පසක් ඇති ප්‍රදේශවල වගා කළ යුතුය නොගැඹුරු මූල පද්ධතියක් ඇති එනසල් ගම්මිරිස් වැනිලා බුලත් වැනි බෝග නොගැඹුරු පසේ වගා කළ යුතු ය .

**අතුරු බෝග වගා කිරීම**

පොල් වගාව සමඟ වගා කරන අතුරු බෝග හෝ බෝග තෝරා ගත් පසුව නිවැරදි වගා ක්‍රම අනුගමනය කළ යුතුය.

- අතුරු බෝග පේලි පේළි නැගෙනහිර හා බටහිර දිශාවට යොමුවන පරිදි යොදන්න

- නිවැරදි පරතර භාවිතා කර පොල් ගසේ සිට මීටර 1.8/ අඩි 6 අතහැර සිටුවන්න
- පැල සිටුවීම සඳහා මධ්‍ය කාලීන හා දිගු කාලීන බෝග සඳහා වලවල් සකස් කළ යුතුය
- වර්ෂාව සමග සමඟ පැළ සිටුවීම ආරම්භ කරන්න
- පැල කාලෙදී සෙවණ ලබාදීම සඳහා වසුන් යෙදීම සිදු කළ යුතුය.
- එක් එක් වගාවට නිර්දේශිත පොහොර ප්‍රමාණය යොදන්න

**අතුරු බෝග වගාවකදී මුහුණ දීමට සිදුවන ගැටලු**

නියගය නිසා වගාවට හානි සිදුවිය හැක, මුල්‍යමය ගැටළු, මිල අස්ථායිතාව ය, තාක්ෂණයේ හිඟය, ශ්‍රමිකයන්ගේ හිඟය, රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීමේදී ඇතිවන ගැටලු, සොරකම්.

**<u>නිසි කලට අස්වනු නෙලීම පිළිබඳව වැදගත්කම විස්තර කිරීම, අස්වනු නෙලීමේ කාල පරතරයන්, ගස් සුද්ද කිරීමේ වැදගත්කම, අස්වනු නෙලීමේ උපකරණ හැඳින්වීම</u>**

නිසි කලට අස්වනු නෙලීම කෘෂි බෝග වල පසු අස්වනු හානිය වළක්වා ගැනීමට උපකාරීවේ. බෝගයක අස්වනු නෙලීමෙන් පසු එය පාරිභෝගිකයා අතට පත් වීමට පෙර එම අස්වනු වලට සිදුවන හානි පසු අස්වනු හානි ලෙස හැඳින්වේ. මෙම හානි අතර අස්වැන්නේ බර අඩු වීම, යාන්ත්‍රික හානි, පසු අස්වනු රෝග, මේරීම හෙවත් වෘද්ධභාවයට පත් වීම ආදිය වැදගත් වේ.

සංවර්ධනය වූ රටවල සිදුවන 10% පමණ වූ පසු අස්වනු හානිය සමඟ හා සසඳන විට ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල එය 20% - 40% වැනි ඉහළ අගයක් ගනී.

**<u>පසු අස්වනු හානිය කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම</u>**

ගොවියාගේ බෝග නිෂ්පාදන වල විකුණුම් මිලත් පාරිභෝගිකයා විසින් වෙළෙන්දාට ගෙවිය යුතු මිලත් අතර පරතරය වැඩිවීමට හේතුව පසු අස්වනු හානියයි.

පසු අස්වනු හානි නිසා පාරිභෝගිකයා අතට පත්වන බෝග නිෂ්පාදන වල ගුණාත්මකභාවය අඩුවන අතර සැපයෙන ප්‍රමාණය ද අඩු වේ.

පසු අස්වනු හානිය නිසා කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය ආදිය යෙදවුම් විශාල ප්‍රමාණයක් අපතේ යයි. නිසි කලට අස්වනු නෙලීම වැදගත් වනුයේ ගොවිපොළෙහි නිෂ්පාදනය වන අස්වැන්න සුරක්ෂිතව පාරිභෝගිකයා අතට පත් කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුය ·

අස්වනු නෙලීම නිසි අන්දමින් සිදු නොකිරීම නිසා වගාවට හානි සිදුවේ. නියමිත පරිණත අවස්ථාවට පැමිණීමට පෙර අස්වනු නෙලීම නිසා ඒවායේ බර අඩුවීම හා ආවේනික වර්ණය හා සුවඳ අඩුවේ.

උදා: අඹ, කෙසෙල්, තක්කාලි

පරිණත අවධියට පසුව අස්වනු නෙලීම නිසා තන්තුමය ස්වභාවය වැඩි වේ.

උදා: බණ්ඩක්කා, මෑ

අධික හිරු එළියේ අස්වනු නෙලීම නිසා අස්වනු මැලවීමකට ගොදුරු වේ. එබැවින් ඒවායේ සංයුතිය හා ස්වභාවය වෙනස් වේ.

උදා: පලා වර්ග

වර්ෂාව හා පින්න ඇතිවිට අස්වනු නෙලීම නිසා ඒවායේ ගබඩා කාලය අඩුවන අතර පහසුවෙන් රෝග වලට ගොදුරු වේ.

උදා: මිරිස්, මිදි, ස්ට්‍රෝබෙරි

එල බිමට කැඩීම නිසා ඒවාට තැලීම්, සීරීම් ආදී යාන්ත්‍රික හානි සිදුවේ. ඒ හේතුවෙන් අකාලයේ ඉදීම හා රෝග වලට ගොදුරු වීම සිදු වේ.

උදා: පැපොල්, අඹ

නියමිත උපකරණ භාවිතා නොකිරිම නිසා අස්වැන්නට මෙන්ම ශාකයටද හානි සිදුවිය හැකිය. උදාහරණ ලෙස දොඩම් අස්වනු නෙලීමට කප්පාදු කතුරක් (සෙකටියරය) වෙනුවට වෙනත් ක්‍රම භාවිතයෙන් ඵලදාවට මෙන්ම ශාකයේ අතු වලටද හානි සිදුවේ.

අස්වනු නෙලීමේදී නටුවෙහි දිග නියමිත ප්‍රමාණයට නොතැබීම නිසා ඵලයට හානි සිදුවේ.

අස්වනු නෙලීමේදී ඉවත්වන කිරි තැවරීම නිසා ඵලයේ පිළිස්සුම් ඇතිවේ.

උදා: අඹ

නෙලන ලද අස්වනු ක්ෂේත්‍රයේ ගොඩගැසීමෙන් උෂ්ණත්වය වැඩිවීම නිසා ඇතිවන ක්ෂේත්‍ර තාපය (Field heat) හේතුවෙන් මාංශල ඵලවළු, පලතුරු හා අලබෝග අස්වනු රෝග කාරක ජීවීන්ගේ ආක්‍රමණ වලට ගොදුරු වේ.

උදා: ගෝවා, අර්තාපල්, රාබු, කැරට්, මිදි

ඵලවළු ගසේ තිබියදී මෙන්ම නෙලාගත් පසුවද ජීව තත්ත්වයේ පවතින නිසා සෑම අවස්ථාවකදීම සැළකිලිමත්ව පරිහරණය කිරීම මගින් පෝෂණ තත්ත්වය රැකගනිමින් හොඳ ගුණාත්මයෙන් යුතු නැවුම් ඵලවළු වෙළඳපොලට ඉදිරිපත් කළ හැකිය.

අස්වනු නෙලීම අතින් හෝ යම් මෙවලමක් යොදා ගනිමින් සිදු කළ හැකිය. මේ සඳහා කතුරු, පිහියා වැනි උපකරණ භාවිතා කළ හැක.

තුවාල සහ සීරීම් ඇතිවීම, බිම වැටීම, තැලීම, පොඩිවීම ආදිය සිදු නොවීමට වගබලා ගැනීමෙන් අස්වනු හානිය අඩු කර ගත හැකිය.

අස්වනු නෙලීමේ දී මේරීමේ තත්ත්වය තීරණය කර ගැනීම සඳහා දර්ශක යොදා ගැනීම සිදු කරයි. දිග, බර, වර්ණය, කැඩෙනසුළු බව, තද බව, මල් පිපීමේ සිට දින ගණන ආදී සරල ක්‍රමද යොදා ගත හැක. එමෙන්ම ඉහළ තාක්ෂණික ක්‍රමද යොදා ගත හැක.

නියමිත වෙලාවට අස්වනු නෙලීම ඉතා වැදගත්ය. නියමිත වෙලාවට පසුව අස්වනු නෙලීමෙන් ඒවා ආහාරයට ගත නොහැකි තත්ත්වයට පත්වීම නිසා නාස්තියද වැඩිවේ.

ඉහළ තාක්ෂණික උපකරණ වල තද බව / ව්‍යුහ ස්වභාවය මැනීමට (Penetro meter) පෙනිට්‍රෝමීටරය යොදාගත හැකිය. එසේම දිග මැනීමටද යොදා ගනී.

<u>**විවිධ බෝග වර්ග වල අස්වනු නෙලීමේ නිර්ණායක**</u>

- බෝංචි, මෑ, බුෂිටාවන්, දඹල
  කරලෙහි උපරිම දිගට පත් වූ පසුව කරලෙහි බිම වෙන් වෙන්ව නොපෙනීම කරල පහසුවෙන් කැඩෙන සුළු බව කරල මහත්වෙන තුරු නොසිටීම.
- තක්කාලි
  10% පමණවත් කහ හා රෝස පැහැති වර්ණය තිබීම. ගෙඩි කහ රෝස පැහැයට පත්වන විට අස්වනු නෙලීම සිදු කළ හැක. අස්වැන්න නෙලන අවස්ථාවේ අත්වැසුම් භාවිතා කර පිරිසිදුව සිදු කිරීම හා ගෙඩියේ නටුව හා මණිපත්‍ර සමඟ නෙලා ගත යුතුය.
- වම්බටු
  වගාකර ඇති ප්‍රභේදය හා පාරිසරික තත්ත්වය අනුව පළමු අස්වැන්න නෙලා ගැනීමට ගතවන කාලය වෙනස් වේ. සාමාන්‍යයෙන් සිටුවා සති 10-12 අතර කාලයක් මේ සඳහා ගතවේ. ඵලය උපරිම දිගට වර්ධනය වූ විට අස්වැන්න නෙලාගත හැක. සතියකට වරක් බැගින් අස්වැන්න නෙලිය හැක. ගෙඩියෙහි පැහැය දීප්තිමත්ව තිබිය යුතුය.
- කරවිල, පතෝල, වැටකොළු

කරලෙහි උපරිම දිගට වර්ධනය වී තිබීම, කරලෙහි විෂ්කම්භය වැඩිවන තුරු නෙලීම පමා නොකරන්න. කරවිල හොඳින් වැඩී මෝරා ඇති අවස්ථාවේ කරල් නෙලා ගන්න. වගාවට දින 60-75 වූ විට පළමු අස්වැන්න ලැබේ. ඉන්පසු දින 4කට පමණ වරක් බැගින් අස්වනු වාර 10-14 පමණ ලබා ගත හැකිය. පතෝල සිටුවා 60-75 දී අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. දින 4කට වරක් පමණ බැගින් අස්වනු නෙලාගත හැක.

- වැටකොළු
  මල් පිපී දින 14කින් පමණ අස්වැන්න ලබාගත හැක. කරලට හානි නොවන පරිදි නටුව සමඟ අස්වැන්න නෙලන්න. වැටකොළු කරලේ නෙරි අතර ඇඟිල්ලෙන් තද කළ විට එබෙන සුළු බව.
- පිපිඤ්ඤා

ගෙඩියෙහි උපරිම දිගට වර්ධනය වීම, පොත්තෙහි පැහැය වෙනස් නොවීම, ගෙඩියෙහි මහත වැඩිවන තුරු නොසිටින්න. ගෙඩි කහ පැහැ වී ඇතිවිට නෙලාගන්න. පිහියක් වැනි ආයුධයකින් ගෙඩියේ නටුව කපා ගන්න.

- මාළු මිරිස් / බණ්ඩක්කා
  කරලෙහි උපරිම දිගට පත් වීමට දින දෙකකට පෙර නෙලීම කරලෙහි අග කෙරවල නැමූවිට පහසුවෙන් කැඩෙන සුළු බව, බීජ පහසුවෙන් කැඩෙන සුළු බව.
- කැරට්, බීට්, නෝකෝල්, රාබු
  ප්‍රභේදය අනුව ගැලවිය යුතු කාලය බීජ මිලදී ගන්නා විටම දැනගෙන නියමිත කාලයට ගැලවීම.
  කැරට් කොළ ඉදීම.
  බීට්, නෝකෝල්, රාබු කොළ හොඳින් වර්ධනය වී තිබීම.
- ගෝවා
  ප්‍රභේදය අනුව අස්වැන්න නෙලන දින ගණන තීරණය වේ. හොඳින් ගෙඩිය වර්ධනය වී තිබීම, ගෝවා ගෙඩිය ඇඟිල්ලෙන් තද කළ විට තද බව.
- ලීක්ස්
  ප්‍රභේදය අනුව අස්වැන්න නෙලන දින ගණන තීරණය වේ. ශාකය හොඳින් වර්ධනය වී තිබීම.
- බඩ ඉරිඟු
  ලපටි අවස්ථාවේ නෙලා ගැනීම නියමිත දින ගණන අනුව අස්වැන්න නෙලීම.
- අර්තාපල්

කොළ වියළී යාම, පසට ජල සැපයුම සිදු කර පස බුරුල් වූ විට නෙලා ගැනීම.

- බතල
  වැල වියලී යාම, පස බුරුල් වූ විට නෙලා ගැනීම.
- කිරි අල

කොළ වියළීමට ඇරඹීම, පසට ජලය සපයා පසුව පස බුරුල් අවස්ථාවේ නෙලීම.

- ඉඟුරු
  අල අදාල විශාලත්වයට පැමිණීම, පසට ජලය සපයා පස බුරුල් අවස්ථාවේ නෙලීම.
- දෙහි
  10% හෝ ඊට වැඩි කහ පැහැ වීම. ගසේ ගෙඩි සියල්ල එකවර නොකඩවා වරින් වර නෙලා ගැනීම, අතින් තද කළ විට එබෙන සුළු බව.
- පලා වර්ග
  පමණට වඩා මේරීම සහ මල් සෑදීමට පෙර නෙලා ගැනීම, හොඳින් ශාකය වර්ධනය වූ විට නොමේරූ තත්ත්වයෙන් අස්වනු නෙලීම.

**අස්වනු නෙලීමේ කාලය**

අස්වනු උදය කාලයේ පිණි හිඳුන පසු නෙලීම වඩාත් සුදුසුයි. පිණි සහිතව අස්වනු නෙලීම මගින් ඉක්මනින් ලෙඩරෝග සෑදී කුණු වීමට තිබෙන ප්‍රවණතාවය ඉහළ යයි. මධ්‍යාහ්නයට ආසන්න කාලයේදී අස්වනු නෙලීම නුසුදුසුය. එසේ නෙලන ලද එළවළු වැඩි කාලයක් තබා ගැනීමට නොහැකිය.

එසේම වර්ෂාව තිබෙන අවස්ථාවේ එළවළු නෙලීමෙන් ඒවා කුණුවී අපතේ යන ප්‍රමාණය ඉහළය. නෙලන ලද එළවළු කිසිවිටකත් අව්වට නිරාවරණය නොකරන්න. එළවළු නෙලීම පොහොර මළු භාවිතා කර සිදු නොකළ යුතු අතර හැකි සෑම විටම ශක්තිමත් බඳුනක් භාවිතා කරන්න. මේ සඳහා කූඩයක්, ප්ලාස්ටික් බඳුනක් හා බේසමක් භාවිතා කළ හැකිය. එසේම නෙලූ එළවළු කිසිවිටකත් පොළොව මත ගොඩ නොගසන්න. එමගින් පස් සහ දූවිලි සමඟ ගැටීම නිසා ලෙඩ රෝග කාරක ඇතුළු වී ඉක්මනින් කුණු වීම සිදුවේ. නෙලූ එළවළු සෙවන සහිත ස්ථානයකට යැවීම සිදු කළ යුතු වේ. එසේම එම එළවළු ගොඩ නොගැසිය යුතු අතර එසේ කළහොත් ඒවායේ උෂ්ණත්වය ඉහළ ගොස් ඉක්මනින් පරිහාණියට පත්වේ. එබැවින් ඒවා හොඳින් වාතාශ්‍රය ලැබෙන සේ තබන්න.

**අස්වනු නෙලීමේ කාල පරතරයන්**

| අතුරු බෝගය | අස්වනු නෙලන කාලය | අස්වැන්න |
|---|---|---|
| කොකෝවා | වසර 5කින් පමණ ප්‍රශස්ථ අස්වැන්න ලබා ගත හැක. | • පරිණත ගසකින් වසරකට සකසන ලද කොකෝවා ඇට1kg පමණ ලබා ගත හැක.<br>• සිටුවීමේ ක්‍රමය අනුව හෙක්ටයාරයකින් සකසන ලද කොකෝවා ඇට 500kg-800kg අතර ප්‍රමාණයක් ලබාගත හැකිය. |
| කෝපි | • සිටුවා තෙවන වසරේදී පමණ.<br>• අවුරුද්දේ මැයි-ජුනි සහ දෙසැම්බර්-ජනවාරි යන අස්වනු නෙලන කාලසීමාවන් වලදී කීපවතාවක්ම පැසුණු ගෙඩි නෙලාගත හැක. | • වසරකට සකසන ලද කෝපි 700g පමණ එක් කෝපි ගසකින් ලබා ගත හැක |
| ගම්මිරිස් | • හොඳින් පාලනය කරන ලද වගාවක් වසර 2ක් ඇතුලත එල දරයි.<br>• වගාවෙන්10% පමණ අස්වැන්න නෙලාගනු ලබන්නේ නොවැම්බර්-ජනවාරි මාසවලය. | හොඳින් නඩත්තු කරනු ලබන වසර 5ක වැලකින් වසරකට සැකසූ ගම්මිරිස් 2-3kg අස්වැන්න ලබා ගත හැකිය. |
| කුරුඳු | සිටුවා අවුරුදු 2 ½කින් පසුව ප්‍රථම අස්වැන්න නෙලිය හැක. | සිටුවා වසර 7ක් පමණ වගාවකින් 200-250kg පමණ අක්කරයක පොල් ඉඩමකින් වසරකට ලබාගත හැක. |
| තේ | තේ පැළ සිටුවා වසර3-4කින් අස්වැන්න නෙලීමට හැකිය. | ඉතා හොඳින් නඩත්තු කරන ලද පොල් සහිත තේ අක්කරයකින් මසකට අමු තේ දළු 800kg ක් පමණ ලබා ගත හැකිය. |
| රඹුටන් | • සිටුවා වසර 3-4 න් පළමු අස්වැන්න ලැබේ.<br>• අවුරුදු 8-10 දී වැඩුණු තත්ත්වයට පත්වේ. | ඉතා හොඳින් වැඩුණු ගසකින් වසරකට ගෙඩි 2000-3000 පමණ ලබා ගත හැක. |
| කජු | • සාමාන්‍යයෙන් කජු මල් හට | එක් ගසකින් සාමාන්‍යයන් |

| | | |
|---|---|---|
| | ගනුයේ ජනවාරි මාසයේදිය.<br>• ගම්පහ වැනි ප්‍රදේශ වලදී පෙබරවාරි-මැයි දක්වා ඵලදා කාලය වේ.<br>• පුත්තලම වැනි ප්‍රදේශ වල මාර්තු-ජුනි දක්වා වේ. | ලැබෙන ඵලදාව වසරකට 5kg වේ. |
| අඹ | • බද්ධ අඹ පැළයක් සිටුවා වසර 3-4 කදී ගෙඩි හටගනී.<br>• අස්වැන්න ලබා ගත යුත්තේ ගෙඩි හොඳින් මේරූ පසුවය. | |
| දෙහි | • අවුරුදු 4-5 පළමු අස්වැන්න ලබාදේ.<br>• අවුරුදු 6කදී ගසකට අවුරුද්දකට ගෙඩි 200 පමණ හට ගනී. | |
| පේර | හොඳින් නඩත්තු කරන ලද බද්ධ පැළ වගාවකින් වසර 2ක් පමණ කාලයකින් පීදීම සිදු වේ. | හොඳින් නඩත්තු කරන ලද බද්ධ පැළ වගාවකින් වසර 8-10කට පසු ගසකින් පේර 40kg පමණ අස්වැන්නක් ලබාගත හැක. |
| අන්නාසි | • තනි පේළි ක්‍රමය- අක්කරයට පැළ 3500<br>• ද්විත්ව පේළි ක්‍රමය - අක්කරයට පැළ 5000 | • |
| කෙසෙල් | • මල් හට ගැනීම පැළ සිටුවා මාස 10-12 කට පසු ආරම්භ වේ.<br>• පරිණත වීමට ගතවන කාලය කෙසෙල් වර්ගය මත තීරණය වේ.<br>• ඇඹුල් පරිණත වීමට ගන්නා කාලය සති 13කි.<br>• කෝලිකුට්ටු සඳහා සති 16 කි. | |
| පැපොල් | • සාර්ථක ඵලදාවක් සඳහා මාස 10-12 කාලයක් ගතවේ.<br>• අවුරුදු 3ක පමණ කාලයක් අස්වැන්න නෙලිය හැක. | ගසකට ගෙඩි 30-40ක් ලබා ගත හැක. |
| වැල් දොඩම් | | වසරකට අක්කරයකින් 4000-5000kg ලබා ගත හැක. |
| බුලත් | • පැළ සිටුවා මාස 3-4 කින් පසු ප්‍රථම අස්වැන්න ලබා ගත හැක.<br>• බුලත් කොටුවකින් වසර 3-5 දක්වා අස්වැන්න ලැබිය හැකිය. | |
| ඉඟුරු | මාර්තු-මැයි කාලයේදී සිටුවන ලද ඉඟුරු එම වසරේ දෙසැම්බර් සිට අස්වැන්න නෙලීමට සුදුසුය. | හෙක්ටයාරයකින් 3000-4000kg ලබා ගත හැකිය. |
| මඤ්ඤොක්කා | • සිටුවන වර්ගය අනුව අල මේරීම වෙනස් වේ.<br>• එය මාස 4-9 දක්වා වේ. | එක ගසකින් 3-10kg ලබා ගත හැක. |
| කිරි අල | සිටුවා මාස 8-9 කින් අස්වැන්න නෙලිය හැක. | පඳුරකින් 500g පමණ අස්වැන්නක් අපේක්ෂා කෙරේ. |

## පොල් වගාව යටතේ සත්ත්ව පාලනය

පොල් වගා කළ ඉඩමක පොල් වගාවට අමතරව සත්ත්ව පාලනය කිරීම සඳහා ඉහළ විභවයක් පවතී. මෙමගින් තිබෙන ප්‍රධාන වාසිය වන්නේ වගාකරුවාට අමතර ආදායම් මාර්ගයක් සැපයීම පමණක් නොව පොල් වගාවට අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණය සපයා ගත හැකි වීමයි.

විශේෂයෙන් පොල් ත්‍රිකෝණය තුල පොල් වගාවේ සත්ත්ව පාලනය සඳහා පවතින විභවය වන්නේ පොල් ඉඩමක පවතින සිසිල් තත්ත්වය සතුන්ගේ වර්ධනය සහ නිෂ්පාදනයට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කරයි. එසේම ප්‍රදේශයේ වෙළඳපොල ඉල්ලුමද සළකා බැලීම වැදගත්වේ. පොල් ඉඩමේ පොල් ගසක් භාවිතා කරනු ලබන්නේ ඉඩමෙන් 25% ප්‍රමාණයක් පමණි. භූමියේ ඉතිරි ඉඩ ප්‍රමාණය සත්ත්ව පාලනය සඳහා යොදා ගත හැක. එසේම තෙත් හා අතරමැදි කලාපයේ පොල් ඉඩම්වල සත්ත්වයන්ට අවශ්‍ය තෘණ වර්ග පහසුවෙන් වගා කල හැක.

දියුණු කල තෘණ වගා කිරීම අවශ්‍ය වනුයේ කිරි ගවයන්, එළුවන් හා බැටළුවන් පොල් ඉඩම් වල ඇතිකිරීමේදීය. මී ගවයන් සඳහා එතරම් අදාළ නැත. ඉතිරි සතුන් අතරින් කිරි ගවයින් ක්‍රමානුකූලව ඇති කිරීම සඳහා දියුණු කල තෘණ වර්ග වගා කිරීම අවශ්‍ය වේ.

**සත්ත්ව පාලනය සඳහා පොල් ඉඩමක විශේෂ සුදුසුකම්**

- පොල් ඉඩමක ඇති අමතර ඉඩකඩ
- බාහිර පරිසරයේ උෂ්ණත්වයට වඩා පොල් ඉඩමක සාමාන්‍ය උෂ්ණත්වය අඩු වේ. මෙම තත්ත්වය සත්ත්ව පාලනය සඳහා ඉතාමත් සුදුසුය.
- තෙත් හා අතරමැදි කලාපයේ පොල් ඉඩම් වල සත්ත්වයන්ට අවශ්‍ය තෘණ වර්ග පහසුවෙන් වගා කළ හැක.

**පොල් ඉඩමේ සත්ත්ව පාලනය කිරීමෙන් ලබා ගත හැකි වාසි**

- අමතර ආදායමක් ලබා ගත හැකිය.
- පොල් වගාව සඳහා කාබනික පොහොර පහසුවෙන් සපයා ගත හැකි වීම
- උපරිම භූමි පරිභෝජනය.

**පොල් ඉඩමේ ඇති කළ හැකි විවිධ සතුන්**

- එළ ගව / මී ගව පාලනය
- එළු පාලනය
- කුකුළු පාලනය
- බැටළු පාලනය
- තෘණ හා කළුකුන් පාලනය
- ඌරන් පාලනය
- මිරිදිය මත්ස්‍ය වගාව

**පොල් ඉඩම් වල සත්ත්ව පාලනය**

කුකුළු පාලනය ඉතා පහසුවෙන් පොල් වගාව ආශ්‍රිතව පවත්වා ගත හැක. පොල් වගා බිමෙහි කුකුල් කොටු සාදා ඒතුළ සතුන් ඇති කිරීම සිදු කරයි.

එළ ගව පාලනය පහසුවෙන් පොල් වගාව තුළ සිදු කර ගත හැකියි. ගව මඩු සඳහා බිම් ප්‍රමානයක් වෙන් වන අතර ඉතිරි බිමෙහි ගවයින්ට ආහාර ලෙස තෘණ වගාව සිදු කර ගත හැක.

බැටළු පාලනයද පොල් වගාවේ පහසු පාලන ක්‍රමයකි. ඕනෑම වයසක පොල් වගාවක දී බැටළු පාලනය ක්‍රියාත්මක කළ හැක. බැටළුවන් උලා කන සත්ත්ව විශේෂයක් හෙයින් ක්ෂේත්‍රයේ නිදහසේ හැසිරීමට මුදා හල හැකිය.

එළු පාලනය ද පොල් වගාව තුළ සිදු කරයි. නමුත් පැළ පොල් වගාව තුළ එළුවන් පාලනය අපහසු වේ.

කළුකුං පාලනය, මී මැසි පාලනය පොල් වගාවේ පාලනයට උපකාරී වන හෙයින් පොල් ඵලදාව වැඩිකර ගත හැකිය. අමතර ආදායමක් ලැබීම, වල් මර්ධනය, පොල් වගාවේ ඵලදායීතාව ඉහළ යාම සත්ත්ව පාලනයේ අමතර වාසි වේ.

*පොල් යටතේ සත්ත්ව පාලනය පහසුවෙන් සිදු කල හැක්කේ තෘණ වගාව සිදු කළ හැකි තෙත් හා අතරමැදි කලාපයේ පිහිටුවා ඇති පොල් වගා බිම් වලය. කිරි ගවයින්, එළුවන්, බැටළුවන් හා මී ගවයන් පොල් ඉඩම් වල ඇති කළ හැක. ස්වාභාවික තෘණ ආවරණයන්හි සත්ත්ව පාලනය සිදු කළ නොහැක්කේ එක් කිරි ගවයෙකුට අක්කර 04 ක බිම් ප්‍රමාණයක්වත් ස්වාභාවික තෘණ ආවරණයක් අවශ්‍ය වන බැවිනි. මේ සඳහා වැඩි දියුණු කළ තෘණ වර්ග පොල් යටතේ වගා කල යුතුය. බ්‍රැකේරියා මිලිපෝමිස්, $CO_3$ හා ජ්ක් ගවයෙකුට දියුණු කළ තෘණ වගා අක්කරයක් ප්‍රමාණවත් වේ.

**පොල් ඉඩම් වල දියුණු කළ තෘණ වගා කිරීම.**

දියුණු කළ තෘණ වගා කිරිම අවශ්‍ය වනුයේ කිරි ගවයන්, එළුවන් හා බැටළුවන් පොල් ඉඩම් වල ඇති කිරීමේදීය. මී ගවයන් සඳහා එතරම් අදාළ නොවේ. ඉහත සතුන් අතරින් කිරි ගවයන් ක්‍රමානුකූලව ඇති කිරීම සඳහා දියුණු කළ තෘණ වගා කිරීම අවශ්‍ය වේ.

පොල් පර්යේෂණ ආයතනය විසින් 1960 දශකයේ සිටම ලෝකයේ ඉතා හොඳම කාණ්ඩයට ගැනෙන තෘණ වගා පර්යේෂණ 140 ක් පමණ පවත්වා ඇත. ඒ අතරින් ඉහළ තෘණ නිෂ්පාදන හැකියාව (අක්කරයට/ කිලෝ 8000 / වියළි ද්‍රව්‍ය) ඇති තෘණ වර්ග 05ක් හඳුන්වා දී ඇත.

- බ්‍රැකේරියා මිලිපෝමිස් - (කෝරි තෘණ)
- බ්‍රැකේරියා රුසිසියෙන්සිස් - (රූසි තෘණ)
- බ්‍රැකේරියා බ්‍රිසන්තා - (සින්ගල් තෘණ)
- බ්‍රැකේරියා ඩික්ටියුනාරා
- සේටේරියා

**පොල් වගාව යටතේ බ්‍රැකේරියා මිලිපෝමිස් තෘණ වගාව**

තෘණ වර්ග අතරින් පොල් ඉඩම් වල සෙවන තත්ත්වය, වියළි ද්‍රව්‍ය, අස්වැන්න, ගවයින්ගේ ප්‍රියතාවය, පොල් වගාව සමඟ තෙතමනය අඩුකම හා පොහොර සඳහා වන තරඟකාරී බව සළකා නිර්දේශ කර ඇත්තේ බ්‍රැකේරියා මිලිපෝමිස් පමණි. අනෙකුත් තෘණ වර්ග වගා කරන්නේ නම් පසේ තෙතමනය හෝ පොල් වගාවේ ජල සම්පාදන පහසුකම් තිබිය යුතුය. මීට අමතරව මෑතකදී පෝෂණ තෘණ (Fodder Grass) වර්ග කීපයක් ද හඳුන්වා දී ඇත. ඒ අතර CO3 තෘණ වර්ගය ඉතා ජනප්‍රියයි.

**CO3 වගා කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු**

- කුඩා ඉඩමකින් ඉතා ඉහළ තෘණ අස්වැන්නක් ලැබීම
- ගවයන්ට ඉතා ප්‍රියමනාප වීම
- විශාල ලෙස නයිට්‍රජන් අඩංගු රසායනික පොහොර යෙදීමේ අවශ්‍යතාවය
- ගව ගාල සේදීයන ජලය, ගව පොහොර ලැබීමට සැලැස්වීම
- මල් පිපීමට පෙර (50% අවස්ථාවේ දී) කපා ගවයින්ට ආහාරයට දීම

1. **පොල් ඉඩම් වල තෘණ වර්ග සිටුවීම**

වැසි සමය අවස්ථාවේදී ඉඩම සී සෑම, හැරෝ කිරීමෙන් පසුව තෘණ දඬු **තෘණ තෘ** සිටුවීම කළ හැකිය.මාස 2-3 යන තෙක් ගවයිනේග් උලා කෑමට ඉඩ හැරිය යුතු නැත.ප්‍රධාන වල් පැළෑටි ඉවත් කළ යුතුය.

## 2. වැඩි දියුණු තෘණ වගා කිරීමට යෝග්‍ය ප්‍රදේශ

තෙත් හා අතරමැදි කලාපයේ පොල් ඉඩම් යෝග්‍ය වේ. වියලි ප්‍රෙද්ශ වල දී තෘණ මගින් පොල් වගාවේ පසේ තෙතමනය සමග තරඟ කරයි.එබැවින් පොල් ඵලදාව අඩු වීමට හේතු වේ.

## 3. වැඩි දියුණු කළ තෘණ වගාව සඳහා පොහොර යෙදීම

රසායනික පොහොර යෙදීම පහසු වන අතර කඩිනමින් ප්‍රතිචාර දක්වයි.ඒ අනුව පොහොර නිර්දේශය වනුයේ සෑම මාස තුනකට වරක් යූරියා කිලෝ 30 ක් අක්කරයට යෙදීමයි.

ඊට අමතරව සැපෝස් පොස්පේට් සහ මියුරේට් ඔෆ් පොටෑෂ් කිලෝ 15 බැගින්ද සෑම මාස 03 ටම වරක් පොල් ඉඩමේ තෘණ වගාවට විසිරුවා යෙදීම අවශ්‍යයි.

පොහොර නොයොදන්නේ නම් තෘණ අස්වැන්න මෙන්ම පොල් ඵලදාවද බෙහෙවින්ම අඩු වේ.

## 4. නිර්දේශිත තෘණ වගා පාලනය සහ ගවයින්ට ආහාර ලබා දීම

එක් ගවයෙකුට දියුණු කළ තෘණ වගා අක්කරයක් ප්‍රමාණවත්ය. ඒ අනුව අක්කර 10ක් සහිත දියුණු තෘණ වගාවක් සඳහා උපරිමව කිරි ගවයින් 10ක්ය. මෙම තෘණ වගාව කිරි ගවයින්ට ආහාරයට දෙන විධි කිහිපයකි.

4.1 මෙම ක්‍රමයේදී ගව ගාලක ඇති කරන ගවයින්ට තෘණ කපා ආහාරයට ලබා දේ. විශාල ලෙස පසේ පොහොර ඉවත් වන බැවින් නැවතත් ගොම තෘණ බිම මත විසිරුවා හැරිය යුතුය.

4.2 උලා කෑමට ඉඩ හැරීම
තෘණ වල වර්ධනය අනුව උලා කෑමට ඉඩ හරිනු ලැබේ. මේ ක්‍රමය වඩාත් ප්‍රායෝගිකයි. ඒ මන්ද, තෝරා ගැනීම මත ගවයින් උලා කෑම සිදුවන අතර, ඒකාකාරව දහවල් කාලය තුළ ගොම පොහොර ඉඩම් තුල විසිරීම ඉබේම සිදුවේ.

**විශේෂ සටහන්**

1. තෘණ වගා කරන්නේ නම් කලින් සඳහන් කල පරිදි ඉඩමට සුදුසු තෘණ වර්ගය තෝරා ගත යුතුය.
2. පොල් ඵලදාවට බලපාන බැවින් තෘණ වගාවට පොහොර සහ පසේ තෙතමනය හොඳින් තිබිය යුතුය.
3. ගවයින්ට තෘණ කපා ආහාරයට දෙනු ලබන ඉඩම් වලදී තෘණ වගාවට ආසන්න ප්‍රෙද්ශයේ ගව ගාල පිහිටුවා තිබිය යුතුය. මේ ක්‍රමයේ දී ගොම හා ගව මුත්‍රා නිරතුරුව ආපසු තෘණ වගාවට ලබා දිය යුතුය.
4. තෘණ වගා බිමෙහි උලා කෑමට ඉඩ හැරීම වඩාත් යෝග්‍ය වන අතර ඒ සඳහා අවශ්‍ය වන පරිදි පොල් වගාව තිබිය යුතුයි. (ගවයින් හෝ පොල් පැළ වලට හානි නොවන අයුරින්)
5. CO3 තෘණ වගා කිරීම වියදම් සහිත වන අතර, ඒ මගින් ඉතා හොඳ ආදායමක් ලැබේ.
6. තෘණ කැපීම සඳහා යන්ත්‍ර අවශ්‍ය වන අතර, තවමත් ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව එය සිදු නොවේ.
7. තෘණ කල් තබා ගැනීම පිණිස Hay හෝ Silage ක්‍රමය දියුණු කළ යුතුයි.
   පොල් ඉඩමක දියුණු තෘණ වගාවක් වෙනත් බාහිර පාර්ශවයන් තෘණ කපාගෙන යාම හෝ ගවයින් දිවා කාලයේ පමණක් බැඳීම සිදු කිරීම, ප්‍රායෝගික නොවන අතර ආර්ථිකව පාඩු සහිත වේ.
8. පොල් ඉඩම් වල තෘණ වගා කර, එම ඉඩම තුළ උසස් ආරයේ කිරි දෙනුන් ඇති කිරීම හා උලා කෑම හෝ නැවත පසේ පෝෂණය පරිසංක්‍රමණය (Translocation) වන පරිදි මනා ලෙස කිරි ගවයින් පාලනය කිරීමේ ක්‍රම ආර්ථික වශයෙන් ඵලදායි වේ. එය ජාතික ආර්ථික සංවර්ධනයට ඉවහල් වේ.
9. පොල් ඉඩම් වල දියුණු තෘණ වගා කිරීම හා ගවයින් ඇති කිරීමේ එක් ප්‍රධාන පරමාර්ථයක් වනුයේ, ගොවිපල පොහොර (FYM) පොල් වගාව සඳහා පොහොර කිරීමට යොදා ගැනීමයි.